# විහාරාරාම පාලනය හා කතිකාවත්

ඒ.එච්.එම්.එච්. අබයරත්න
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

දෙදෙනෙක් හෝ ඊට වැඩි පිරිසක් එක්ව සම්මත කර ගන්නා අදහස් "කතිකාවත" නම් වේ.

නිදසුන්:

1. තෙන ඛො පන සමයෙන සාවත්ථියං සංඝෙන කතිකා කතා හොති අන්තරාවස්සං න පබ්බාජෙතබ්බං ති (මහාවග්ග පාලි)

2. තෙන ඛො පන සමයෙන සාරිපුත්ත මොග්ගල්ලානා සඤ්ජයෙ පරිබ්බාජකෙ බ්‍රහ්මචරියං චරන්ති. තේහි කතිකා කතා හෝති යො පඨමං අමතං අධිගච්ඡති සො ඉතරස්ස අරෝචේතුති (මහාවග්ග මහාක්ඛන්ධක)

මේ නිදසුන් අනුව, සම්මුතිය, ගිවිසුම, තීරණය වැනි අර්ථවල කතිකා ශබ්දය යෙදී ඇති බව පැහැදිලිය.

මෙම කතිකාවත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් දැකිය හැකිය.

1. විහාර කතිකාවත් 2. ශාසන කතිකාවත්

කිසියම් විහාරයක් හෝ ආයතනයකට අයත් විහාර කිපයක ක්‍රියාකාරිත්වයට අදාළව පනවන ලද ව්‍යවස්ථා විහාර කතිකාවත් ලෙස ද, සමස්ත ලංකාවාසී මහා සංඝයා උදෙසා පනවන ලද ව්‍යවස්ථා ශාසන කතිකාවත් නමින් ද දැක්වේ.

ඉහත කී ආකාරයේ විහාර කතිකාවත් ලෙස

- 5 කාශ්‍යප රජුගේ අනුරාධපුර දෑවරු ලිපිය (EZ. Vol. I, No. 4)
- වෙස්සගිරියේ අංක 1 පුවරු ලිපිය - වීරාංකුරාරාම ලිපිය (EZ Vol. I, No. 2)
- උදාමහයාගේ පුලියන්කුලම ලිපිය (EZ Vol. I, No. 15)
- IV වන සේනගේ කළු දිය පොකුණ ලිපිය (EZ Vol. III, No. 27)
- IV වන මිහිඳුගේ අභයගිරි පුවරු ලිපිය 2 (EZ Vol. I, No. 19)
- IV වන මිහිඳුගේ වෙස්සගිරි පුවරු ලිපිය 2 (EZ Vol. I, No. 2)
- IV වන මිහිඳුගේ මිහින්තලා පුවරු ලිපිය 2
- අභයගිරි සංස්කෘත ලිපිය (EZ Vol. I, No. 1)
- VI වන පරාක්‍රමබාහුගේ පැපිළියාන ලිපිය (ජයතිලක, ඩී.බී. කතිකාවත් සඟරාව)

දෙවන ගණයේ ශාසන කතිකාවත් ලෙස

- පොළොන්නරුවේ ගල් විහාර ලිපිය (මහා පරාක්‍රමබාහු කතිකාවත) (EZ Vol.II,No. 41)
- පොළොන්නරුවේ හැටදාගෙයි පුවරු ලිපිය (නිශ්ශංකමල්ල කතිකාවත) (EZ Vol. I, No. 16)
- දඹදෙණි කතිකාවත (කතිකාවත් සඟරාව)
- ශ්‍රී පරාක්‍රමබාහු හෙවත් VI වන පරාක්‍රමබාහු කතිකාවත (කතිකාවත් සඟරාව)
- කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත (කතිකාවත් සඟරාව)
- ශ්‍රී රාජාධිරාජසිංහ කතිකාවත (කතිකාවත් සඟරාව)